මුල් පිටුව
ඇතුල පිටු
පුවත්
දේශපාලන
ආරක්ෂක
විශේෂාංග
ආර්ථික
කතුවැකිය
ශාස්ත්‍රීය
සිනමා කලා
ක්‍රීඩා
විදෙස් පුවත්
අපගේ වෙබ් අඩවි
The Island
විදුසර
නවලිය

**පුවත්**

## පැෆ්පරල් සංවිධානයෙන් මැතිවරණ ප්‍රචාරක වියදම් පනතක්

රනිල් ධර්මසේන

මැතිවරණයකදී දේශපාලන පක්ෂවලට හා අපේක්ෂකයන්ට ප්‍රචාරක කටයුතු සඳහා දැරිය හැකි උපරිම වියදම් සීමාව ඇතුළත් පනත් කෙටුම්පතක් සකස් කර රජයට භාරදීමට පැපරල් සංවිධානය තීරණය කර ඇත.

පළාත් පාලන මැතිවරණ අපේක්ෂකයන්ගේ සිට ජනාධිපතිවරණ අපේක්ෂකයා දක්වා සියලු අපේක්ෂකයන්ට ඒ ඒ මැතිවරණවලදී දැරිය හැකි ප්‍රචාරක වියදම්වල සීමාවන් එම පනත මඟින් පැනවෙනු ඇත.

එමෙන්ම මැතිවරණයකට තරග කිරීමේදී දේශපාලන පක්ෂවලට දැරිය හැකි වියදම් ද සීමා කිරීමට යෝජනා කර තිබේ.

මෙම කෙටුම්පත පිළිබඳව දේශපාලන පක්ෂවල නිත්‍ය නියෝජිතයන් හා මැතිවරණ නිරීක්ෂණ සංවිධාන වෙත ඉදිරිපත් කර යෝජනා ලබාගැනීමට පැපරල් සංවිධානය පියවර ගෙන තිබේ. ඉදිරියේදී සිවිල් සංවිධාන හා දේශපාලන පක්ෂ සමඟ ද සාකච්ඡා කර පළාත් පාලන ඇමැතිවරයාට භාරදීමට සැලසුම් කර ඇති බව එම සංවිධානයේ විධායක අධ්‍යක්ෂ රෝහණ හෙට්ටිආරච්චි මහතා "දිවයින" ට පැවසීය.